# බෙල්ලන්විල අත්තිඩිය

# තෙත් බිම



## තෙත්බිම් සංරක්ෂණ ව්‍යාපෘතිය

**නෙදර්ලන්ත රජයේ මුදල් හා තාක්ෂණික සහාය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය මගින් තෙත් බිම් සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ශ්‍රී ලංකාවේ තෙත් බිම්වල දත්ත රැස් කිරීම ව්‍යාපෘතියේ වැදගත් කාර්යයකි. මෙම දත්ත ඇසුරින් තෝරාගත් තෙත් බිම් කීපයක් සඳහා සංරක්ෂණ කළමනාකරණ සැලසුම් සැකසීම හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කෙරේ.**

## ප්‍රදේශය :

බෙල්ලන්විල - අත්තිඩිය තෙත් බිම පිහිටා ඇත්තේ කොළඹ නගරයට ආසන්නව ගිණිකොණ දෙසිනි. විටින් විට යටවන තෘණ බිම් හා නොගැඹුරු පොකුණු වලින් හා තැන තැන විසිරී ඇති පඳුරු වලින්ද, බොල්ගොඩ ඇළ දෙපස කුඩා ගස් වලින් ද, සමන්විත වේ. 1980 වනතෙක් මෙහි වී වගා කරන ලදි. දැන් බොහෝ ඉඩම් විවිධ තුරුලතා මගින් වැසී ඇති අතර, ඒ මගින් අන් පෙදෙස්වල දැකිය නොහැකි විවිධ වර්ගයන්ට අයත් වනජීවී සමූහයකට නිවහන් ලබා දෙයි.



# ඔබ දන්නවාද ?

## බෙල්ලන්විල අත්තිඩිය තෙත් බිම :

- 1989 දී පවත්වන ලද ජාත්‍යන්තර ආසියානු තෙත් බිම් දත්ත රැස් කිරීමේ දී ශ්‍රී ලංකාවේ වැදගත් තෙත් බිම් 41 න්, එක් ස්ථානයක් වශයෙන් හඳුනාගත් බව,
- 1980 දී නගර සංවර්ධන අධිකාරිය මගින් තෙත් බිම් මහා සැලැස්ම යටතේ, අධ්‍යාපනික හා සංරක්ෂණ පෙදෙසක් වශයෙන් හඳුනාගත් බව,
- 1990 දී වනජීවී අභය භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කළ බව,
- මෙහි කුරුල්ලන් වර්‍ග 142 ක් ද, සමනලයින් වර්‍ග 61 ක්ද, මාළු වර්‍ග 43 ක්ද, ජීවත්වන බවට වාර්‍තා වී ඇ ති බව,
- පරිසරවේදීන් ඉතා ඉහළින් අගය කරන අවට නගර වාසීන්ට විවේක සුවය ලබාදෙන ස්ථානයක් බව ,
- සංරක්ෂණ අධ්‍යයනයට පරිසර අධ්‍යයනයට හා පර්යේෂණ කටයුතුවලට මහඟු අවස්ථාවක් සලසන බව,
- ගං වතුර හා පරිසර දූෂණය පාලනය කිරීම කෙරේ ඉමහත් වැදගත්කමක් දරණ බව,

## මෙම ප්‍රදේශය සෘජු හා නිරන්තරව තර්ජන රැසකට මුහුණ දී ඇත. ඒවායින් සමහරක් නම් :

- නිවාස හා කර්‍මාන්ත අපද්‍රව්‍ය ගොඩ ගැසීම.
- අනවසර ලෙස තෙත් බිම ගොඩකිරීම හා පදිංචිවීම.
- අවට කර්‍මාන්ත ශාලා හා රත්මලාන කර්මාන්ත පෙදෙසින් භූගත හා මතුපිට ජලය අපවිත්‍රවීම.
- මනා පරිහරණයකින් තොරවීම හේතුවෙන් ජල මාර්‍ග ඇහිරී ගොඩවී යන පරිදි ජලාශ්‍රිත පැලෑටි වැඩීම.
- තෙත් බිම හා අවට ප්‍රදේශය නිරන්තර ගංවතුර තර්ජනයට මුහුණදීම.
- මසුන් මැරීම, ගස් කැපීම, විශේෂයෙන් ජලාශ්‍රිත කුරුල්ලන් ඇතුළු සතුන් ඇල්ලීම හා හිරිහැර කිරීම වැනි සවභාවික පරිසරය සීමා රහිතව පරිහරණය.
- ප්‍රමාණවත් නීති-රීති නොමැතිකම හා අදාළ ආයතනයන්ගේ සුපරීක්ෂණය ප්‍රමාණවත් නොමැතිකම.





මෙම කරුණු කෙරෙහි අවධානය යොමු කරන මධ්‍යම පරිසර අධිකාරියේ තෙත් බිම් සංරක්ෂණ ව්‍යාපෘතිය, විධිමත් ක්‍රියාමාර්ගයක් නොගත හොත් මෙම වටිනා පෙදෙස පරිහානියට පත්වන බව තේරුම් ගෙන ඇත. මේ නිසා පහත සඳහන් ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කෙරේ.

- අපද්‍රව්‍ය ගොඩ ගැසීම පිළිබඳව තදින් පාලනයක් ඇති කිරීම.
- ජලාශ්‍රිත වල් පැලෑටි ඉවත් කිරීම හා පාලනය, (විශේෂයෙන් සීඝ්‍රයෙන් වැඩිවන දිය හබරල වැනි පැලෑටි) ඇතුළුව ජලමාර්ග ප්‍රතිසංස්කරණයන් හා යළි ප්‍රතිශ්ඨාපනය, ඇතුළු කටයුතු.
- ඉඩම් ගොඩ කිරීම හා අනවසර පදිංචිය පිළිබඳ තදබල පාලනයක් කිරීම.
- මසුන් මැරීම, ගස් කැපීම තණ කොළ කැපීම පිළිබඳ බලපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීම.
- වන ජීවීන්ට සහ ගහකොළ වලට යෝග්‍ය වාතාවරණයක් සැකසීමට අවශ්‍ය ජල පද්ධතියක් හා වගුරු ප්‍රදේශ යළි ක්‍රමවත්ව සැකසීම.
- සංචාරක මධ්‍යස්ථානයක් ගොඩ නැගීමෙන් පරිසරවේදීන්ට හා පරිසරය අගයන්නන්ට මහඟු අවස්ථාවක් සැලසීමත් අපද්‍රව්‍ය ඉවත් කිරීම සහ අභය භූමිය සුරකින ක්‍රම සහ විධි සැකසීම.
- පත්‍රිකා, දැන්වීම් හා තොරතුරු ඇතුලත් පොත්පත් බෙදාහැරීම හා මෙහි ජීවත් වන විවිධ සතුන් විස්තර කෙරෙන දැන්වීම් පුවරු මගින් මහජන අවබෝධය වැඩි දියුණු කිරීම.
- ක්ෂේත්‍ර චාරිකා සඳහා සංචාරකයින්ට හා පාසැල් සිසුන්ට අවස්ථාව සලසාදීම.

## පිහිටීම




අනුග්‍රහය - මධ්‍යම පරිසර අධිකාරිය

**ව්‍යාපෘතියේ ලිපිනය :**

**තෙත් බිම් සංරක්ෂණ ව්‍යාපෘතිය ;**
**මධ්‍යම පරිසර අධිකාරිය ,**
**පළමු මහල , මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,**
**කොළඹ 10,**
**ශ්‍රී ලංකාව.**

**දුරකථන අංක : 01/439073/4**






පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේත්, මධ්‍යම පරිසර
අධිකාරියේත් නෙදර්ලන්ත තානාපති කාර්‍යාලයේත් මෙහෙයවීමෙන්
ශ්‍රී ලංකාවේ තෙත් බිම් ආරක්‍ෂා කර ගැනීම පිළිබඳව පසුගිය දා කොළඹ
තාජ් සමුද්‍රා හෝටලයේ පැවති සම්මන්ත්‍රනයේ දී ප්‍රධාන අමුත්තා වශයෙන්
සහභාගි වූ පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු ඇමති
ගරු එම්. වින්සන්ට් පෙරේරා මැතිතුමා සභාව ඇමතූ අවස්ථාව.
පාරිසරික අමාත්‍ය, ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ
රාජ්‍ය අමාත්‍ය ආචාර්‍ය විමල් වික්‍රමසිංහ මැතිතුමා ද
මෙම අවස්ථාවට සහභාගිවිය.